Rev A Atdasena.

# A GLOSSARY

TO

# THUPAWANSA

BY

A. S. PERERA,
KADAWATA.

## සිංහල ථූපවංස
## ග්‍රන්ථිපද විස්තරාර්ථ වර්ණනා.

කඩවත
ඒ. එස්. පෙරේරා මහතා
විසින් ලියනලදී.

ජේ. ඩී. ප්‍රනාන්දු
විසින්
කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයේ මුද්‍රිතයි.

1923.

Price cts. 50. 25 [7] 23. මිල ශත 50.

# සංඥාපනය.

මේ වනාහි අපගේ ග්‍රන්ථිපද විවරණ පඞ්ක්තියෙහි දස නවවන ග්‍රන්ථයයි. ථූපවංස නම්වූ ධර්මග්‍රන්ථය අධ්‍යාපන දෙපාර්තමෙන්තුව විසින් ගුරුවරුන්ට තුන්වනපෙළ සහතික පත්‍රදීමේ විභාගයට සූදානම් වන්නන් සඳහා නියමකරතිබේ. ගැඹුරු වචන රාශියක් මෙහි දක්නා ලැබෙන හෙයින් ග්‍රන්ථිපද විවරණයක් ලියා ප්‍රසිද්ධකරනමෙන් පාඨශාලාචාර්‍ය්‍ය මහතුන් කිහිප දෙනෙකුන් හා ආධුනිකයන් කිහිපදෙනෙකු විසින් අපෙන් අයැද සිටි හෙයින් මේ ග්‍රන්ථය අප විසින් ලියනලදී. මෙහි යොදන ලද ග්‍රන්ථිපද සියල්ලටම යථාර්ථයෙන් විවරණයක් ලිවීමෙහිද අක්‍ෂර වින්‍යාසාදිය හරි ආකාරයෙන් යෙදීමෙහිද මෙකල මුද්‍රිතව පවත්නා පොත් දෙකටම සාධාරණ වන පරිද්දෙන් පිටු පිළිවෙලින් සකස් කිරීමෙහිද පරිශ්‍රම ධැරිමු. * එසේ වුවත් මේ කෘතිය දෝෂ ස්ථානයන්ගෙන් විමුක්තියයි ප්‍රකාශ කිරීමෙහි අපි මැලිවෙමු. එහෙයින් මෙහි යම් වද්‍යස්ථානයක් දෝෂාංශුවක් දුටහොත් උගත් මහත්මෝ සමාධිය භජනය කිරීමෙන් එය අපවෙත් දන්වත් නම් මැනවයි අයැද සිටිමු. මෙය මුද්‍රණය කිරීමෙහිදී සිදුවූ දෝෂ ස්ථාන කීපයක් සංශොධනය කොට ශුද්ධිපත්‍රයක්ද යෙදීමු. උපග්‍රන්ථයක් යෙදීමට අදහස්කළ නමුත් මුද්‍රණය කිරීමෙහි ප්‍රමාදයක් නිසා එය ඉවත්කරන්ට සිදුවූ බවද මතක්කරමු.

තවද මේ සංස්කරණය සතුටින් භාරගෙන මුද්‍රණය කරවනලද කොළඹ ජේ. ඩී. ප්‍රනාන්දු මහතුන් වෙත අපගේ කෘතඥතාව මෙසින් මතක්කර සිටිමු.

A. S. P.

වර්ෂ 1923 ක්‍රි.ව. මාර්තු මස
7 වෙනි දින කඩවතදීය.

* වරහන් වලින් යොදා තිබෙන්නේ ඩී. බී. විජයශේඛර මහතා විසින් සංශෝධිත ග්‍රන්ථයේ පිටුවල අංකයන් බව සැලකිය යුතුයි.

Rev. A Atulasena

# සිංහල ථූපවංස
# ග්‍රන්ථිපද විස්තරාර්ථ වර්ණනා.

## සාමාන්‍ය සංලක්ෂණය.

"සංඥං නිමිත්තං කර්තාරම් පරිමාණම් ප්‍රයොජනම්
ප්‍රාගුක්ත්වා සර්වතන්ත්‍රාණම් පශ්චාදිවක්‍යානුවර්ණයෙත්."

යනු හෙයින් සංඥාදිහු කවරහයත්?

1 සංඥාව { සාමාන්‍ය-ධර්ම ග්‍රන්ථයක්. / විශෙෂ-ථූපවංසය.

2 නිමිත්ත { බාහ්‍ය-පෙළඹස්හි අවියත් ජනයා. / අභ්‍යන්තර-මහකුශල ප්‍රාර්ථනාව හා නිවන්දැකීම.

3 කර්තෘ —සකල විද්‍යාචක්‍රවර්ති උපාධිනාමධාරි පරාක්‍රම පණ්ඩිතොත්තමයාණෝ *

4 ප්‍රමාණය—සමතිසක් පමණ කථායි.

5 ප්‍රයොජනය { බාහ්‍ය-ධාතුබෙදීම, ධාතුනිධානය, බෞද්ධධර්ම ප්‍රතිෂ්ඨාපණය, රත්නමාලි ආදි චෛත්‍ය විස්තරාදිය, දුටුගැමුණු රජයන්ගේ හා දශ මහ යොධයන්ගේ ජීවන චරිත කථා දැනීමාදිය.
අභ්‍යන්තර-බෞද්ධසමයානු විෂයෙහිවූ ස්වර්ග මොක්ෂ සම්පත්තින් කෙරෙහි කරන ප්‍රාර්ථනාව. මේ හැර මේ ග්‍රන්ථය රචනාකරන සමයෙහි ලක්දිව පැවති භාෂාරීතිය හා වාක්‍යරචනාදිය දැනීමට මෙම ග්‍රන්ථය ආධාරවේ.

6 කාලය—මතභෙදයි, සාමාන්‍ය කල්පනාව 13 වන වර්ෂයෙහිවූ දඹදෙණි පරාක්‍රමබාහු රජාණන්ගේ සමයවේ. † මේ පරාක්‍රමබාහු නරෙන්ද්‍රයානම් කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු මහාරජාණෝයි.

---

* සිංහල ථූපවංසයේ කර්තෘ සකල විද්‍යා චක්‍රවර්ති පණ්ඩිත පරාක්‍රම විජය බාහු රජොත්තමයාණෝයයි කිසි පණ්ඩිත කෙනෙක් සලකත්.

† කලිකාල යනු යුධයෙහි යමරජු හෙවත් මාරයා යන අර්ථයි. නොහොත් පව්හරන්නා යනුයි. මේ රජයාගේ යුධ දක්ෂතාව නිසා හෝ ධාර්මිකතාව නිසා හෝ කලිකාල යන නාමයද, අලඞ්කාර ශාස්ත්‍ර සියල්ලම මනාවදත් හෙයින් සාහිත්‍ය සර්වඥ යන නාමයද ව්‍යවහාර කරන ලද බැව් සිතීමට කරුණු පැනේ.

කිසිපණ්ඩිත කෙනෙක් මේ ග්‍රන්ථය 12 වන ශත වර්ෂයෙහිදී කරනලද්දේයයි කියත්. එසේ කීමට හේතුව මෙහි කර්තෘහු යථොක්ත විජයබාහු රජ යාණන්යයි සිතීමයි. 13 වන ශත වර්ෂයෙහි මේ කරන ලදයයි සිතීමට ප්‍රධාන හේතුවවූයේ යථොක්ත දඹදෙණි පරාක්‍රමබාහු රජුකල විද්‍යා ත්‍රිපිටකාචාර්ය්‍ය භදන්ත වාචිස්සර මහාස්ථවිරපාදයන් විසින් කරනලද පාලිභාෂාමය ථූපවංසය සිංහලට නගන ලද්දේය යන හැඟීමයි.

**7 මූලාශ්‍රය**—චතුර්විංශත් බුද්ධවිවරණයෙන් පටන්ගෙන ථූප වර්ණනා, ධාතුවර්ණනා, ධාතුබෙදීම, ධර්මාශොක, දෙවානම්පියතිස්ස යන රජදරුවන්ගේ සම්බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපනය, දුටුගැමුණු, එළාර යන රජුන්ගේ යුද්ධාදිය, දුටුගැමුණු රජයාගේ හා දශමහායොධයන්ගේ චරිත කථාදිය විස්තර කර රත්නමාලි චෛත්‍යය වර්ණනා කිරීමයි.

**8 නාමාර්ථය**—ථූපවංස යනු මාගධ භාෂාමය සමාස පදයෙකි. සංස්කෘත භාෂානුගතව ස්තූපවංශ වියයුතුයි. චෛත්‍යයන්නෙන් සෑ යනු තද්භව වේ. රත්නමාලි යන්නෙන් රුවන්මැලි කියාද, රත්න වාලුකායන්නෙන් රුවන්වැලි කියාද, තද්භව වේ.* රුවන්මැලි සෑය රුවන්වැලිසෑය යන නාම දෙකම මේ නයින් ශිෂ්ටව්‍යවහාරයෙහි ගැණේ.

* පාලිපොත්වල රතනමාලික රතනවාලුක යන නාම පෙනේ.

## ථූපවංස ග්‍රන්ථිපද

# විස්තරාර්ථ වර්ණනා.

### 1. වන පිට.

අනන්තවූ=(න+අන්ත) කෙළවරක් නැත්තාවූ, සීමාරහිතවූ, අප්‍රමාණවූ.

කරුණාවෙන්=දයාවෙන්, දුකට පැමිණි සත්ත්වයන් කෙරෙහි පවත්නා දයාවෙන්.

ෂඩ්අසාධාරණඥාන=අනිකකුහට සාධාරණ නොවන නුවණ (සයක්) එනම්–ඉන්ද්‍රියපරොපරියත්තඥානය, ආසයානුසයඥානය, යමකපාටිහීරඥානය, මහාකරුණාසමාපත්ති ඥානය, සබ්බඤ්ඤුත ඥානය, අනාවරණ ඥානය, යන සයයි.

චතුවෛශාරද්‍යඥානය=සතර ආකාර විසාරදඥානය, එනම්– බුදුන් "සම්‍යක් සම්බුද්ධයෙමි"යි කීකල තා විසින් අනභිසම්බුද්ධයහයි කියන්ට කිසි දෙවිමිනිස් බඹ ආදී කෙනෙක් ලොකයේ නොද ඇති(බව) "ක්ෂීණ ශ්‍රවයෙමි" යි කීකල නැති මෙනෙක් ආශ්‍රවයෝ තා විසින් අපරික්ෂණයහයි කියන්ට කිසිකෙනෙක් ලොකයෙහි නොද ඇති (බව) මේ ධර්මයෝ ස්වර්ග මොක්ෂයට අන්තරාය කරහයි කීකල නැති මේ ධර්මයෝ අන්තරායකර නොවෙයි කියන්නට කිසි කෙනෙක් ලොකයෙහි නොද ඇති (බව) මේ ධර්මයෝ නෛර්‍යාණිකයයි කීකල නැති මේ ධර්මයෝ අනෛර්‍යාණිකයහයි කියන්නට කිසිකෙනෙක් ලෝකයෙහි නොද ඇති (බව) යන සතර ස්ථානයෙහි තමන්ගේ විසාරද භාව ප්‍රත්‍යවෙක්ෂකරන බුදුන්ට උපන් සෞමනස්‍යඥානය, ප්‍රදීපිකාව බලා විස්තර දතයුතු.

අෂ්ටපර්ෂද්=ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ගෘහපති, ශ්‍රමණ, චාතුර්මහාරාජික, තව්තිසා, මාර, බ්‍රහ්ම යන අටපිරිස්.

අකම්ප්‍යඥානය=කම්පාකල නොහැකි නුවණ, ස්ථිරබුද්ධිය.

ඤාණවත්වූ=ඥානය ඇතිවූ, නුවණින් යුත්වූ.
විශාරදවූ=අධිකවූ, සමර්ථවූ.
වාදපථයෙක්=කථාමාර්ගයෙන්, වාදයට පැමිණෙන්නෙක්.
භුවනත්‍රයට=ලොකතුනට; ස්වර්ග, මර්ත්‍ය, පාතාල නොහොත් රූප, අරූප, කාම, යන තිලොවට.
විනයනය=හික්මීමට පත්කිරීම.
සහසිකවූ=කොපවන්නාවූ, කිපෙන්නාවූ.
අඞ්ගුලිමාල=ඇඟිලිමාලාවක් මෙන් එල්ලාගත් සොරෙක්.
අපරිමිතවූ=පරිමිතනූවූ, මෙපමණයයි ප්‍රමාණයක් නැතිවූ.
අතුල්‍යවූ=තුල්‍යනූවූ, සමානනූවූ. [කිවූ.
අවාච්‍යවූ=වචනයෙන් කියනොහැකිවූ, වර්ණනාකළ නොහැ
තිඹක්=ලාස්සතරක්.
නිධානකළ=තැන්පත්කළ.
රත්නමයන්=මැණික් වලින්, රත්නනවවර්ගයෙන් පමණකොට දක්වා තිබේ-ඔව්හු නම්- රන්, රිදී, මුතු, මැණික්, වජ්‍ර (දියමනති) ගෝමේද, වෛරළුමිණි, පබළු, නීල, පුෂ්පරාග, පච්ච යනුවෙත්.
උජ්ජ්වලිතවූ=(උ+ජ්වලිතවූ) දිලිසෙන, බබලන, බැබලීම ඇති. [අළුසි.
රත්නමාලි=රුවන්මැලි, රත්නමාලායෙන් බඳනාලද යනු
සාවධානව=වික්ෂිප්තනොවී, කලබල නැතිව.
අවික්ෂිප්තව=(අ+වික්ෂිප්තව) සිතනොයෙක් අත්ට නොයොදවා එකම කල්පනාවක යොදා.
දසාව=දෙස, පැත්ත.
සාරාසඞ්ඛ්‍යකල්පලක්ෂය=(සාර+අසඞ්ඛ්‍ය+කල්ප+ලක්ෂය) අසංඛ්‍ය කල්ප ලක්ෂසතරක්, කල්පයෝ වනාහි අන්තඃකල්පය, අසඞ්ඛ්‍යකල්පය, මහාකල්පයයි ත්‍රිවිධවෙත් අන්තඃකල්පයක් වනාහි මනුෂ්‍යායුෂ දශවර්ෂයේ පටන් ආරම්භව ක්‍රමයෙන් අසඞ්ඛ්‍යායුෂය දක්වා නැගීගොස් නැවත ක්‍රමයෙන් පහතබැස දශවර්ෂය දක්වා අඩුවීමට ගතවන කාලයයි. අන්තඃකල්ප විස්සක් අසඞ්ඛ්‍යකල්පයකි. මෙහි වර්ෂප්‍රමාණයෝ එකය දශය, ශතය, සහස්‍රය යනාදීන් සඞ්ඛ්‍යා ක්‍රම

ඉක්මවා සිටින හෙයින් අසඞ්ඛ්‍යකල්ප නම් වේ. සංවර්තය, සංවර්තස්ථායිය, විවර්තය, විවර්තස්ථායියයන සතර අසඞ්ඛ්‍යකල්පයෙක් එක්වූකල්හි මහාකල්පය නම්වේ. තවද යොදුනක් උස යොදුනක් පුළුල සිදුරු රහිත පර්වතයක් හවුරුදු සියකට වරක් සිනිඳු වස්ත්‍රයක් හැදගත් කෙනෙකු ඒ මුදුනෙන් යනවිට ඒ වස්ත්‍රය ගෑවී පර්වතය ගෙවෙතත් නොගෙවන තරම් කාලයයි උපමාකොට ඇති දීර්ඝකාලයක් කල්පයකි.

ඔබ්බෙහි=පෙර, එහා.
රූපශොභාවෙන්=ශරීරයේ යහපත් ලක්ෂණයෙන්.
සම්පත්තීන්=සැපතින්, ඉසුරෙන්. [අළුසි.
අමර=(අ+මර) එනම් දෙවියෝ, මරණයක් නොමැති යනු
අමරවති=දඹදිව පුරාතන පිහිටි අමරාවති නම් රාජධානිය.
අයාමෙන්=ඇවෑමෙන්, මරණයෙන් පසු. [කාරයා.
අයකැමියා=ආදායම එකතුකරන්නා, අයවැයබලන්නා, මුදල්
ලේකම්=ලියවිලි, ආදායම් ගණන් ලිපි.
අයවැය=ආදායම් හා වියදම.
මුතුන්මිමුතුන්=මුත්තා (සීයා) හා මුත්තාගේ මුත්තන්.
පරවිටියෙහි=පරම්පරායෙහි.

## 2 වන සීම.

යාචක=සිඟන, සිඟන්නන්.
සත්රුවන්=සප්තරත්නයන්, චක්‍රරත්නාදි සත හෝ මුතු මැණික් ආදිරුවන් සත.
මුවරදසළායෙන්=මල්පැණි සමූහයෙන්, රේණු සමූහයෙන්.
සන්තර්පණයකොට=පිනවා, සතුටුකොට.

( 2 )

කෙළියෙක=ක්‍රීඩාවෙක, සෙල්ලමක.
ලැව්ගිනි=දවාගනි, වනයේ හටගත්ගින්න.
මතැතක්හුමෙන්=මත්තහස්තියකුසේ.
විශ්වකර්මයා=සියලු කර්මදන්නා, එනම් ශිල්පකර්මයෙහි නිපුණ දෙවියෙක්. [භූමිය.
උත්පත්තිස්ථාන= (උත්පත්ති + ස්ථාන) උපදිනතැන, ජන්ම
ත්වක්පත්‍රාදිය=සුඹුල් හා කොළ ආදිය.
පඤ්චාභිඥා= (පඤ්ච+අභිඥා) අභිඥාපස, ඍද්ධිවිධඥානය, (ඍද්ධි ප්‍රභෙද දන්නා ඥානය) දිව්‍යචක්ෂු ඥානය, පරචිත්ත විජානනඥානය (අනුන්ගේ සිත්දන්නා ඥානය) පූර්ව නිවාසානුස්මෘතිඥානය, දිව්‍යශ්‍රොත්‍රඥානය යනපස.

අෂ්ටසමාපත්ති=අටවිධධ්‍යානය, ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ යන රූපාවචර සතර ධ්‍යානයද ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන අරූපාවචර ධ්‍යාන සතරද යන අට.

ධ්‍යාන=දැහැන, භාවනාකිරීම.

සසරවැද=සංසාරයට පැමිණ, භවොත්පත්තියට පැමිණ.

සම්තිස්පෙරුම්=පාරමිධර්ම සමතිස, දශපාරමිතා, දශඋපපාරමිතා, දශපරමාර්ථ පාරමිතා යන තිස.

පාරමිතාදශය නම්–

දානං සීලඤ්ච නෙක්ඛම්මං පඤ්ඤාවිරියෙන පඤ්චමං
ඛන්ති සච්චමධිට්ඨානං මෙත්තුපෙක්ඛා ඉමෙදස.

යනුවෙන් ප්‍රකාශ දාන, ශීල, නෛෂ්ක්‍රම, ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්ෂා යන මොව්හුයි.

පස්මරුන්=මාරයන් පස්දෙන, ක්ලෙශමාර, අභිසංස්කාරමාර, අන්තකමාර, ස්කන්ධමාර දෙවපුත්‍රමාර යන පස්දෙන.

විදුරස්නෙහි=වජ්‍රාසනයෙහි.

සුදර්ශනවිහාරය=මනාදැකුම් ඇතියනු තේරුමඇති විහාරයක්.

ගඞ්ගාප්‍රවාහයක්=ගංගාවක ගලායන දියපාරක්, ගලන ගංගා ජලයක්.

කොල=බොල, එම්බල.

## 3 වන පිට

වහන්දෑ=වහන්සේ, වහන්සේලා.

උදයගිරි=සූර්‍ය්‍යාඋදාවන පර්වතය, මෙහි පර්වතයක් නොවූවත් උපචාර වශයෙන් උදාගිරියයි කියනු ලැබේ.

කුළුනැමතිවොටුන්නෙහි=මුදුන් නැමති ඔටුන්නෙහි.

පද්මරාගමාණික්‍යයක්= පියුම්රාමැණික, නෙළුම්මල්වැනි රක්තවර්ණයෙන් බබළනමැණික.

එසමයෙහි= ඒකාලයෙහි.

සෙවුනා අදහසින්=භාවිතය කරන කල්පනාවෙන්, පරිභොග කරන අදහසින්.

රත්හුගසා බෙදන්නාසේ= රතුහූලක්ගසා කොටස්කරන්නාක් මෙන්.

විලාසයෙන්=ආකාරයෙන්.

රම්‍යනම් නුවර=රඹ (ගම්) නම් නගරය.

( 3 )

මඟුල්පටහ=මඞ්ගල්‍ය බෙරවැයීම.
සරසව්දෑසි=සරසනුදූසි අලඞ්කාරකරනු දූසි.
මෝහ=මූඪකම, මුළාව, අඥානකම.
ළහිරුමඬල=උදයේ සූර්‍යමණ්ඩලය, අධිකරශ්මියෙන් වියුක්ත හිරුමඬල.
ළපලුවයට=ළාකොළ සමූහයට, අලුත් දළුසමූහයට.
ළැව්ගිනිකලඹක්=වනයේම වෘක්ෂයන්ගෙන් උපන් ගිනි සමූහයක් (ගිනිගොඩක්)
අභිසංස්කාර=රැස්කිරීම්, පිළිවෙළ කිරීම්. [මක්.
හෙදමන්ත්‍රයක්= වෙන්කරන මැතිරීමක්, කඩකිරීමට මැතිරී
වශවර්තිමාරයා= වසවත්මරු, සිදුහත් බෝධිසත්ත්වයන්ට බුදුවීනොදෙමි''සි පැමිණි එනම් මාරයා.
සෙණක්=හෙණයක්, අකුණක්.
දනව්සැරිසරා=ජනපදයක් පාසා ගමන්කර.
තෙලෙ=ඔය, අර.
ඔබවඩනාමග=උන්වහන්සේ වඩිනාමාර්ගයෙහි.
කප්සුවහසකින්=කල්ප දශසහස්‍රයකින්, කල්පලක්ෂයකින්.
තිලෝගුරු= තුන්ලෝකයට ආචාර්‍යවූ ස්වර්ග, මර්ත්‍ය, පාතාල නොහොත් රූප, අරූප, කාම යනු තිලොවයි.
ශර්කරා=සකුරු.
වක්කමක්=වක්කුළු අගක්, සකුරු උණුකොට බහලන වක් කුළු අගක්.
ප්‍රීතිරසයෙන්=ප්‍රීති නැමති රසයෙන්.
සන්තාන=සිත්, සිතිම්,
දෙව්දුවක=දෙවතා දූවකුගේ.
ගිලිහීබිමහුණු=ගැලවී බිම වැටුණු.
රත්නකඤ්චුකයක්=රුවන් පඬුවක්.
පවිත්‍රප්‍රාන්තයක්=පවිත්‍ර අද්දරක්, කඳුකෙළවරක්.
කඳුරැළියක්=කඳුවලින් ගලායන දියපාරක්, ගිරිකඳුරක්.
පරසතුමලින්=පාරිජාත පුෂ්පයෙන්, දිව්‍යලොකයෙහි පිහිටි පාරිජාත වෘක්ෂයේ මල්වලින්.
කඩුපුල්මල්=නාලොව මල් විශෙෂයක්.
මෙරපත්ලෙන්=මහමෙර පාමුලෙන්.
කප්රුකින්=කල්පවෘක්ෂයෙන්, කප්රුක්පුසෙකි.
දුහුල්=(කල්පවෘක්ෂයෙහි ලනලද) දුහුලවස්ත්‍ර, කොමුරෙදි.

රහතන්=ක්ෂීණාශ්‍රවයන්, කෙලෙස්නැසූවන්, සෘද්ධිබලය ඇත්තන්.

**4 වන ඡීම.**

රුක්පෙළක්=වෘක්ෂපංක්තියක්, ලොකුගස් පෙළක්.

කප්ගිනිගත්=හාත්පස ගිනිගත්, වටේට ගිනිගත්.

රුවන් මෙරක්=රත්නපර්වතයක්.

සවණක්රැස්=සයආකාර පාටින්යුත් රශ්මීන් නීල, පීත, ලොහිත, අවදාත, මාංජිෂ්ඨ, ප්‍රභාස්වර යන පාට සය.

ඡද්දන්තනාම්හස්තියා=ඡද්දන්තවිලෙහි වසනඇතා, දත් සයක් ඇති ඇතා.

සහම්පති=එනම් මහාබ්‍රහ්මයා. (4)

සරස්ධුරය=කුඩය ඇල්ලීමේ තනතුර, ඡත්තග්ගාහකධුරය.

සප්තබොධ්‍යඞ්ගධර්ම=බුදුබව පතන්නහුගේ සත්ආකාර ධර්ම, සමාධි, සති, ප්‍රීති, පස්සද්ධි, විරිය, ධර්මවිචය, උපෙක්ෂා යන සත.

වෙලාන්තය=වෙරළ, සමුද්‍රයේ ඉවුර.

තරඞ්ගපඞ්ක්ති=රළ පෙළ.

ලවණරසයෙන්=ලුණුරසින්.

මෛත්‍රිරසයෙන්=මෛත්‍රිය නැමති රසයෙන්.

මධුරවූ=මිහිරිවූ.

ව්‍යාමප්‍රභා=බුදුන්ගේ ශරිරයෙන් නිකුත්වූ බඹයක් පමණවූ රැස් සමූහය.

උදානශබ්ද=ප්‍රීතිශබ්ද, ප්‍රීතිහඬ.

ධ්වනි=හඬ, ඝොෂාව.

පොදබාරු=පොදවහනයවීම, පොදවැටීම.

මෙඝයා=වලාහකයා, වැස්ස.

ත්‍රිකූට=තුන්කුළු, ශිඛරතුන, සුවෙල නම් පර්වතය.

සප්තධර්මන්නැමති=සත්ආකාර ධර්මනැමති.

අලින්ද=පිල, ගෙයි එකපැත්තක් හෝ ගෙයි ඉදිරිශාලාව, ඉස්තෝප්පුව (අභිධානප්‍රදීපිකාව බලා විස්තර දත යුතුයි.)

සිවුවනක්පර්ෂද්= සතර ආකාර පිරිස, බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සතරකුල පිරිස.

සතරමාර්ගඥාන=සොවාන් සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන මාර්ගය පිළිබඳ නුවණ, සතර මගට පැමිණෙන නුවණ.

අෂ්ටවිධලොකධර්ම=ලාභය, අලාභය, අයසය, යසසය, නින්දාවය, ප්‍රශංසාවය, සුඛය, දුඃඛය යන පැවතුම් අට.

අනන්ත=(න+අනන්ත) කෙළවරක් නැති, බොහෝ.

5 වන පිට.

ලෞකිකොපමා= (ලෞකික+උපමා) මේ ලෝකයේ පැවතුම් සම්බන්ධ උපමා.

ධර්මෝපමා=(ධර්ම+උපමා) ධර්මය පිළිබඳ සමාන කිරීම, සමාන ධර්මකථා

ලොකොත්තර=(ලොක+උත්තර) ලොකයෙන් උත්තර, ලොක ස්වභාවට වඩා උසස්.

රාජසුකුමාරසේක=මොලොක් රජකෙනෙක්වනසේක. නො දැඩි රාජ්‍යයක.

බුද්ධසුකුමාරවනසේක=මොලොක් බුදුකෙනෙක් වනසේක.

අඩාලහෙයින්=බාගයක් හෙයින්, අසම්පූර්ණ හෙයින්.

කලල්ව=මඩව. [අටක්.

අටෝරාසියක්=(අට+උතුරු+සියක්) අටක් වැඩි සියක්, එකසිය

මගුල් ලකුණෙන්=මඞ්ගල ලක්ෂණයෙන්.

ප්‍රභාසාරය=කාන්තියෙන් බැබළීම අධික බව.

රන්පෝරුහෙයක්=රනින් සැදූ ලෑලි ඒදණ්ඩක්.

වල්කල=සුඹුල් පොතු.

අඳුන්දිවිසම්=අඳුන්වර්ණ ඇති කොටිහම්.

සිව්පිළිසිඹියාපත්=අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන යන සතර විධ මනාදැනීමට පැමිණි, චතුපටිසම්භිදාප්‍රාප්ත ඥානයට පැමිණි.

අශරණීය=සරණක් නැති බවට පැමිණි.

(5)

සූවිසි අසංඛ්‍යක්=අසංඛ්‍ය විසිහතරක්.

බොධිසම්භාර=බුදුබව පිරීම, බුද්ධත්වය පිණිස පූරන පිරීම.

කල්පවෘක්ෂය=කප්රුක, ඉල්ලූදෙය ලැබේයයි සලකන ගස, කල්පරුක් පසෙකි.

සර්වඥතාඥාන=ආවර්ජනා විශෙෂයෙන් සියලුදේ දන්නානුවණ.

අමාඵල=අමෘතඵල, දිව්‍යභොජනීයඵල.

සමෘධවේද්‍යෝහෝසි=වැඩිවේද්‍යෝහෝසි.

අෂ්ටාඞ්ගයෙන් යුත් ශබ්ද=අඞ්ගඅටෙන් යුත් ශබ්ද, විස්සට්ඨ, විඤ්ඤෙය, මඤ්ජු, සවනීය, බින්දු, අවිසාරි, ගම්භීර නින්නාදි යන ශබ්දඅට.

6 වන පිට.

* ජටාධරවූ=ජටාව දරන්නාවූ; ජටිලයාවූ. [තෙජස.

තපෝතෙජස්=(තපස්+තෙජස්) තපස් කෙනෙකුට තිබියයුතු

කිඹුල්වත්=කපිලවස්තුපුරය, කපිලතපස්වී විසූ වනයෙහිවූ හෙයින් ඒනුවර කපිල නම්විය.

---

* ගාථාවල සන්නය උපග්‍රන්ථයෙහි අඩංගුවේ.

ප්‍රසූතවී=බිහිවී, ඉපිද.
එකුන්තිස්වසක්=(එක්+ඌන්තිස්) විසිනවවසක්.
මහාභිණික්මන්=තපස් පිණිස ගිහිගෙයින් පිටත්වයාම.
තුන්යලක්=තුන්වරක්.
පැදකුණුකොට= ප්‍රදක්ෂිණකොට, ගෞරවයෙන් දකුණට කැරකැවී.
ඇසතුබෝරුක=අශ්වත්ථබෝධි වෘක්ෂය, ඇහැටුබෝගස.
විසානකත=වෛශාඛනක්ෂත්‍රය,නකත් 27න්16යවන නැකත.
අග්‍රෝපස්ථායක= (අග්‍ර+උපස්ථායක) ප්‍රධාන උපස්ථායකයා සමීපයට පැමිණ සත්කාර කරන ප්‍රධානියා.
විවරණදී= ව්‍යාකරණදී, ප්‍රකාශයදී.
යුගඳුරු=යුගන්ධරය, මහාමෙරවටා පිහිටි සප්ත පර්වතයෙන් ප්‍රධානඑක, මහෙන්ද්‍රානම් පර්වතය.

මහෙන්ද්‍රා මලයඃ සහ්‍යඃ ශුක්තිමාන්, ඍක්ෂපර්වතඃ
වින්ධ්‍යශ්ච පරියාත්‍රශ්ච සප්තෛතෙ කුලපර්වතාඃ

යනු සප්තකූටවලට සංස්කෘත පොත්වල ව්‍යවහාර නාමයි.
සස්නෙන්=ශාසනයෙන්, ආගමෙන්.

(6)

අධිගමයක්=පිළිගැනීමක්, දැනීමක්.
අධිගමලබමෝවයි=ඥානය ලබම්හයි, පිළිගැනීම ලබම්හයි.
බුද්ධකාරක ධර්මයන්=බුද්ධත්වය සිද්ධකරන ධර්ම.

## 7 වන පිට

එකත්පස්ව=එකපැත්තකටවී, මූණට මූණලා නොසිට ගෞරව වශයෙන් පැත්තකටවී සිට.
අනුමෙවෙනිබණ=වැළඳීමට අනුව දෙසන ධර්මය, අනුමෙවෙනියනු අනුමෝදනාවයි.
කාමයන්ගේ=රාගාදි ආශාවන්ගේ.
ආදීනව=දොස, අගුණ.
ලාමකබව=මෝඩබව, දුරනොදක්නාබව.
සකිලිටිබව=කුණුසහිතබව, කිලුටුකම.
අනුසස්=ආනිසංසය, බලය, මහිමය.
ත්‍රිවිද්‍යායෙහි=තුන්ප්‍රකාර විශෙෂ දැනීමෙහි, පෙරවිසූ කඳ පිළිවෙල දන්නා පූර්වනිවාසානුස්මෘතිඥානය, දිව්‍යචක්ෂු නම් දිවසින්දන්නා නුවණ ආශ්‍රවක්ෂයකරඥානය නම්වූ කෙලෙසුන් නැසීමෙන්වන ඥානය, යන තුන් ඥානය.
[බලනු )
ෂඩ්අභිඥායෙහි=විශෙෂසෙන් දැනීම්සය. (පඤ්චාභිඥා යනු
නිරුපධිශෙෂ= (නිර්+උපධි+ශෙෂ) නැවත උත්පත්තියෙන් තොරවූ.

නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන්=උපධි සැපයෙන් නිර්ශෙෂවූ නිර්වාණයෙන්, නිර්වාණ ධාතුව වනාහි සොපධිශෙෂ හෙවත් කෙලශපරිනිර්වාණය නිරුපධි හෙවත් ස්කන්ධපරිනිර්වාණයයි දෙයාකාර වේ.

අෂ්ටසමාපත්තිය= 2 වන පිට සම්බන්ධ විස්තරය බලනු.

රන්හුලින්=රත්රන් උළුවලින්.

සූත්‍රපිටකය=බුදුන් වදාළ දික්, මැඳුම්, සංයුත්, අඞ්ගුත්තර, කුදුගොත් යන සඟී පසින් යුත් බුද්ධධර්මය.

කෙළලක්ෂයක්=කෝටිලක්ෂයක්, ලක්ෂයේ ඒවා කෝටියක්.

සක්විතිරජව=චක්‍රවර්තිරජව, චක්‍රරත්නයේ බලයෙන් රජකරන රජු, චක්‍රරත්නය නම් සක්විති රජුන්ට පිනින් ලැබෙන සෘද්ධියෙන් යාහැකිවූ රත්නයකි.

## 8 වන පිට.

අභිධර්මපිටකය=බුදුන් විසින් දෙවියන් ප්‍රධානව වදාළ ධම්ම සඞ්ගණී, විභඞ්ග, පුග්ගලපඤ්ඤත්ති, ධාතුකථා, මූලකථා, යමකකථා, පට්ඨානකථා යන සත්ප්‍රකරණය.

විනයපිටකය=පාරාජිකා, පචිති, සුළුවග, මහවග, පරිවාර යන සඟී පසින් යුත් බුද්ධධර්මය.

පඤ්චාභිඥා= පස්අයුරු වෙසෙසා දැනීම්– ඔව්හු නම්– සෘද්ධි ප්‍රභෙද දැනීමේ නුවණ, දිව්‍යකනින් අසා දැනගැනීමේ ඥානය, අනුන් සිත් දැන ගැනීමේ නුවණ, පෙරවිසූ ජාතිපරම්පරා දැනීමේ නුවණ, දිවැසින් බැලීමේ නුවණ.

අපරිහීනධ්‍යානයෙන්= (අ+පරි+හීන+ධ්‍යාන) සම්පූර්ණ ධ්‍යාන[යෙන්.

බුද්ධකෘත්‍යයන්=බුදුවරයකු විසින් කළයුතු ක්‍රියා.

සිරියෙල්=හිරියල්.

පැනට=වතුර පිණිස.

මහාබොධිසත්ත්ව=බුදුබව පතන මහතාණෝ.

දෙයාසඞ්ඛ්‍ය=(දෙ+අසඞ්ඛ්‍ය) අසංඛ්‍ය දෙකක්.

ගෞතම=ගොතම, එනම් කුලයෙහි උපන් සිද්ධාර්ථනම් බුදුරජාණෝ.

ව්‍යාකරණ=විශෙෂයෙන් ප්‍රකාශකිරීම, විවරණය; විවරණනම් බෝසත්කෙනෙකු දුටුකල බුදුකෙනෙකුන් විසින් මේ තෙමේ අසවල් කලැ අසවල් නමින් බුදුවන්නේයයි කරනලද ප්‍රකාශයයි.

**9 වන පිට. (8)**

දිව්පිළි සඟලක්=දිව්‍යමය වස්ත්‍රදෙකක්.
ආරාමකාය්‍ය=ආරාම සම්බන්ධ කටයුතු.
අසඞ්ඛ්‍යයක් කප්=කල්ප අසඞ්ඛ්‍යයක්.

**10 වන පිට.**

අගාමක=ග්‍රාමයක් නැති, ගමකනොපිහිටි, ගම නම් මිනිසුන් වැඩිගණනක් ගෙවල්තනා ගෙන වාසය කරන පෙදෙසකි.

අරණ්‍යයෙහි=කැලෑයෙහි, වනයෙහි.

සිංහයොනියෙහි=සිංහජාතියෙහි, සිංහදෙනුවක කුසයෙහි. "සහ යොන් සතුන් කියලු-සඳ ඉතිරි ලිඟුනම්."

නිරොධසමාපත්තිය=අටවනු සමාපත්තිය, නිරොධයනම් නිර්වාණයයි; අෂ්ටසමාපත්ති යනුබලනු.

සමවැද=ධ්‍යානය පිණිස පැමිණ.

ප්‍රව්‍රජ්‍යාවෙන්=පැවිදිවීමෙන්, මහණවීමෙන්.

අනාථයන්ට=නාථනොවන්නන්ට, පිහිට නැත්තන්ට, බල හීනයන්ට; නාථශබ්දයෙන් ප්‍රධාන බව කියත්.

**11 වන පිට.**

භද්‍රකල්පයට=එනම් කල්පයට. භද්‍රයන්නෙන් මඞ්ගල්‍ය, උතුම් උසස්, හීනනොවන අර්ථයෙනදේ.

ජටිල=ජටාවක් ඇත්තා යනුයි.

මහරැටියක්ව=රටනායකයෙක්ව, මහා ජනප්‍රධානියෙක්ව.

අසමසම=අසමානයන්ට සමවූ, බුදුවරයන් වහන්සේට සමවූ වෙක් නොමැත්තේය යන අර්ථයෙන් අසමසම නම් වේ. අසමනම් බුදුන්ට සමහෙයින් අසමසම වන්නේය.

සුමෙධ=මේධයෙන් බබළන්නේය යන අර්ථයි.

උත්තරනම් මානවකව ඉපිද=උත්තර නම් තෙමේ මානවකවූ සමයෙහි සුමෙධබුදුන් හමුවටපත්වූ බැව් මෙයින් ප්‍රකාශකෙරේ.

බුදුපාමොක්=බුදුන් ප්‍රමුඛව, බුදුන් ප්‍රධානකොට ඇතිව.

සතර මහාවිපයේ= මහාවිපසතරේ සතරමහාවිපයෝ නම් ජම්බූවිපය, උතුරුකුරු දිවයිනය, අපරගොයානය, පූර්වවිදෙහය යනුවෙත්.

අතම්කාසිය=තමාගේ කටයුතු.

## 12 වනපිට. (11)

තුන්වෙද=ත්‍රිවෙද, ඍග්, යජුර්, සාම යන වෙදතුන, මේවෙ දයෝ මහාබ්‍රහ්මයා විසින් ප්‍රකාශකරන ලද්දෝ යයි හින්දු දේශවාසීහු විශ්වාස කෙරෙති. ඍග්වෙදයනම් ප්‍රථම වෙදයයි. ගිනි වායු ආදිය දෙවතාකොට ඔවුන්ටත් දෙවියන්ටත් සතුටින් යාච්ඤාකරන ශාස්ත්‍රයයි. යජුර්වෙදයෙහි දෙවතාවන්ට කරන පූජායාච්ඤා ක්‍රමය ප්‍රකාශයි. ඒ කෘෂ්ණය ශෙවේත යයි විවිධාකාරයි. සාමවෙදය නම් ගීතිකා සින්දු වෘත්තවලින් යාච්ඤාකිරීම ප්‍රකාශ කරනලද ශාස්ත්‍රයයි.

මඤුරා=මඤ්ර, පරසතු, පාරිජාත.

දශබලධාරි=බලදශයක් ධරන්නාවූ.

ඵකාතුවන=අනූඑක්වන.

## 13 වන පිට.

උගුවූ=උසස්, තද, නපුරු වැඩි.

ඉෂවාඵයෙන්=(ඉෂට+අඵයෙන්) කැමතිවන ලද අභිප්‍රායෙන් ගහපත් අඵයෙන්.

(12)

යශොපරිවාර=(යශස්+පරිවාර) කීර්තිය හා පිරිවර.

ඍඬ්‍යනුභාවයට=(ඍඬි+අනුභාවයට) ඍඬිබලයට, අහසින් යාම් ආදි මහබලයට.

දිවමඤුරාපියුම්=දිව්‍යමඤ්රපුෂ්පයන්.

සිවුවනක් පිරිස්=සතර ආකාර සෙනග, බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන සතර වර්ගයට අයත් සේනාව නොහොත් සිවුපිරිවරයි. එනම් මහණ මෙහෙණි උපාසක, උපාසිකායි

## 14 වන පිට. (13)

කපපියභාණ්ඩ=සඞ්ඝයාවරුන්ට කැපවූ බඩු, ශ්‍රමණ පරිෂ්කාර.

සස්නා=ශාසනය.

## 15 වන පිට.

අඳුන්=අඤ්ජනය, ඇසේ ගාන අඳුන.

සස්නා=ශාසනය.

ගිලන්=මහලුකමින් ලෙඩව, රොගාතුරවීම, පිඩාවට පැමිනීම.

(14)

පතතුණ්ණදෙශය=පවවසත්‍ර උපදිනදෙශය, මිශ්‍ර(මිසර)දෙශය වියහැකියි.

චීනදෙශය=චීනදෙශය, චීනරට.
කොසෙය්‍යපිළි=සේදවස්ත්‍ර, පටවස්ත්‍ර.
පලස්=කම්බිලි, ඝන රෙදි විශෙෂයක්.
දුහුල්=දුකුලවස්ත්‍ර, පට්ටාපිළි.
රත්පටක්=රන්දැමයක්, රත්රන්මාලයක්.
ඝටීකාර=කුම්භයන් (කළගෙඩි) සාදන්නා, කුඹලා, මෙකල බඩහැලයායයි කියනු ලැබේ.
වතාවත් සැපතින්=උපස්ථාන සැපයෙන්.

16 වන පිට.

විවරණලත් නියාව=විවරණ ලැබූ අන්දම.

**ප්‍රථමකථා නිමි.**

---

සූවිසි=(සිව්+විසි) විසිහතර, (වකාරයාගේ ලොපය හා වකාරස්ථ උකාරයාගේ ලොපයද සකාරයාගේ පිළිවිපර්‍යාසයද සිඩයි.)
සමත්‍රිංශත් පාරමිධර්මයන්= සමතිසක් පෙරුම්දම්, දශපාරමිතාය, දශඋපපාරමිතාය, දශපරමාර්ථපාරමිතා යන තිස.
විශ්වන්තරතමභාවයෙහි=වෙස්වන්තර නම් රජයෙක්ව ඉපදි ජීවිතයෙහි.
කුශලසම්භාර=කුශල්රැශිය, කුශල්භාරය.

(15)

ආයුඃප්‍රමාණයෙන්=ආයුෂ පමණින්.
සක්වල=චක්‍රවාට වල.

17 වන පිට.

අනිත්‍ය=(අ+නිත්‍යය) නිත්‍යභාවයක් නැති; ස්ථිරව නොපවත්නා.
දුක්ඛය=දුකය
අනාත්මය=තමාය කියන්ට යමක් නැති ස්වභාව
“මමය මාගේ මේ - සිත වරදවා දැනු මේ
බලා අඩුරුව මේ-ඉසාදුරු ලියකැයි සිතා වැනි මේ”
අභිසමය=දැනීම, අවබොධය.
නෛර්‍යාණික=කිලෙසටම පමුණුවන ස්වභාව ඇති, නිර්වාණයට අයිති.
මෙර=මහමෙර, මේරුපර්වතය.
අනික්තුන් මුහුණ=අනික් තුන්පැත්ත.

වෛශ්‍යකුලය=වෙළඳකුලය ආඪ්‍යකුලය,
ක්ෂුද්‍රකුලය=කුඩා කුලය, හීනකුලය, ශුද්‍රවංශය.
ලෝකසම්මතය=ලෝකයෙහි (උසස්යයි) නියමයෙන් පිළිගන්නා ලද්ද.
සුරාධූර්තනොවෙති=රාමෙරයපානය කරනතක්කඩි නොවෙති. ධූර්තශබ්දයෙන් වංචා,තක්කඩි යන අරුත්ගෙනදේ.
අඛණ්ඩවූ=ඛණ්ඩනොවූ, නොහෙදවූ, නොකැඩුණු.
පඤ්චමහාවිලෝකනය=මහපස්බැලුම, බුදුකෙනෙකුන් ලොව ඉපදීමට පෙර කාල, දීප, දෙශ, කුල, මවු යන පස කෙරෙහි මනාසේ කරන බැලීම. i කාලවිලෝකනය නම් මනුෂ්‍යයන්ගේ අතිහීන නූවූද ඉතා අධික නූවූද කාලය වෙසෙසා බැලීමයි. ii දෙශවිලොක්නය නම් ප්‍රත්‍යනතනූවූද බුදුවරයන්ගේ උත්පත්තිස්ථානයවූද බුධශාසනය පැවැත්වීමට නිවාසිවූද මධ්‍යදෙශයක් වෙසෙසා බැලීමයි. iii දීපවිලොකනනම් බුදුවරයන්ගේ උත්පත්තිය නිත්‍ය උත්පත්තියට හෙතුවූ ඒපයවෙසෙසා බැලීමයි. iv කුලය වෙසෙසා බැලීම. v සුදුසු මෑණියන් වෙසෙසා බැලීම. එයින් කීහ.

"කාලං දීපංච දෙසඤ්ච කුලං මාතර මෙවච
එතෙ පඤ්චවිලොකෙත්වා උප්පජ්ජන්ති තථාගතා"යි

ප්‍රතිඥා=පොරොන්දු, ගිවිසුම්.
සමුදී=අවසරදී, අවසර ලබා.

18 වන පිට. (16)

විගත සුරාපාන ඇති=හරනලද සුරාපානය ඇති.
අෂ්ටාඞ්ගසීලය=අඞ්ගඅටකින් යුත් ශිලය, අටසිල්.
සතරවරම් රජදරුවෝ=චාතුර්මහාරාජික දෙව්රජහු. ඔව්හු කවරහයත්? විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ, ධෘතරාෂ්ට්‍ර යන සිවුදෙනයි.
අනවතප්තවිල=හිමාලවනයෙහි පිහිටිවිලක්, හිරුරස්නයෙන් නොතැවෙන්නේය යන අර්ථයි.
දෑවාණ්අතලෙක=පළිඟුගල් තලාවක.
අලතාපිරියම් කළාක්වැනි=ලාකඩවලින් (පරිකර්මය) පිළියම් කළාක්සේ, ලාකඩවලින් රතුවට සාදා වාත්තු කළාසේ, මෙයින් තොල්වල රක්තභාවය හා මට සිලුටුභාවය හැඟවූහ.

කෛලාශපර්වතය=එනම් පර්වතය, හිමාලපර්වතයේ මුදුනක්, කුවේරයාගේ වාසයවූයේ මෙහියි.

දකුණුළැය=(දකුණු+ඇළය) දක්ෂිණ අංශය.

තුෂිතභවනය= තුසිතනම් දිව්‍යලොකය, තුසිතයනු එහි සන්තුෂ්ටිය ඇත්තේ යන අළුසි.

සෞමනස් සහගත=සතුටින් යුක්ත.

ඥානසම්ප්‍රයුක්ත සංස්කාර කුශලචිත්තය= නුවණින් බැඳුණු සංස්කාර කුශලින් යුක්තසිත.

විපාකචිත්තයෙන්=දෙවරක් පිරිසිඳුකරනලද සිතින්.

අසූමහසව්වෝ=මහාශ්‍රාවක අසූපිරිස, ශාරිපුත්‍ර, මුගලන් ආදි කොට ඇති අග්‍රශ්‍රාවක අසූ නම.

පසේබුදුහු=ප්‍රත්‍යෙකබුදුහු, තමන්ට නිවන් දක්කහැකි අන්‍ය පුද්ගලයන් නිවන් දක්විය නොහැකි බුදුහු.

චුතික්ෂණයෙහි=චුතවන කෙණෙහි.

චුතිචිත්තය=චුතවයාමේ සිත.

ප්‍රතිසන්ධිචිත්තය=පිළිසිඳ ගැනීමේ චිත්තය.

සතරවනගර්භාවක්‍රාන්තියෙන්=සතර ආකාර කුසපිළිසිඳගැනීමෙන්.

ධර්මකථිකයක්හුමෙන්= ධර්මදෙශනා කාරයකුමෙන්, ධර්මකථා කාරයකුසේ.

මණිබන්ධයෙන්=මිණිබහනෙන්, මැණික් කටුව.

ජ්‍යොතිරඞ්ගමාණික්‍ය=ස්වභාවයෙන්දිලිසිමෙන්යුක්තමැණික දෑරගමිණ, රතුකැටය, පළිඟුමැණිකයයිද කියත්.

රත්පලස්හුයක්=රතුකම්බිලි නූලක්.

19 වන පිට. (17)

යුගාන්තවාතසාගරතරඞ්ගපඞ්ක්තියක්=යුගය කෙළවරවීමේදී වාතයෙන් සාගරය චංචලවී නගින රළපෙළක්.
"ප්‍රලයෙ භින්නමර්‍ය්‍යාදා භවන්තිකිල සාගරඃ."

අත්සන්කොට=අතින් සංඥාකොට.

උද්දාම සාගරයෙහි=රළින් උඩට නැගීගිය සාගරයෙහි.

උද්දාම=එසවීම.

කල්පලතාවක්=කප්ලියක්.

රන්ලිය වනයක්=ස්වර්ණලතා වනයක්.

චිත්‍රලතාවනය=ශක්‍රයාගේ එක් උයනක්.

පස්වනක් බඹරගණන්=වර්ණපසෙක බමර සමූහයන්.
කුල්මතින්=උඩඟුවෙන්.
රන්සිව්ගෙය=සුවර්ණමය දොලාව,
මඟුල්සල්ගස=රජුපැමිණ ගිම් නිවීම් ආදිය කරන සෙවණ යට අසුන් පිහිටි ශාලවෘක්ෂය.
රුක්පෙළද=වෘක්ෂපංක්තියද.
මෘදඞ්ග=මිහිඟුබෙර, මෙඝධ්වනිය, අහස් ගිගිරීමේ නාදය.
සිසාරන් නාක්මෙන්=වටකරන් නාක්මෙන්.
මෘගාඞ්ග නාවන්=මුවදෙනුන්.
හංසාඞ්ග නාවක්=හංසධෙනුවක්.
ළපලලවයන්=ළාකොළ, ළාපත්‍ර.
හස්තපල්ලවය=අතුල්තලය, අතුල්තල නැමති පත්‍රය.
තුල්‍යනාකොට=සමානකොට, තුල්‍යකොට.
රන්කම්කළ=රත්රන්වැඩකළ, රනින් විසිතුරු වැඩකළ.
කොමුපිළියක්=දුහුල්වතක්, පට්ටවස්ත්‍රයක්.
මසක්හු=මත්ස්‍යයකු.
මැකිණියකා=මකුණියක් විසින්.
විළිදුහ=ප්‍රසවකළහ.
බණපලඟ=වාඩිව බණකියන ආසනය.

**20 වන පිට.** (18)

ප්‍රහීණවූ කාමරාග ඇති=කාම ආශාව නැතිකළ.
සුඬාවාසිකා=එනම් බ්‍රහ්මලොකවාසී.
මඟුල් ගැත්තෝද=මඞගල්‍ය මෙහෙකරුවෝද.
පහස්ඇති=ස්පර්ශය ඇති, ගැහැටීම ඇති.
සුවර්ණාඞකුරයක්= (සුවර්ණ+අඞකුරයක්) රත්රන් පැළැටියක් පොළොවෙන් නගින මොටෙයියා අඞකුරය නම්.
එකාඞ්ගනාවූ=එකම මිදුලවූ.
නිදුකාණනී=දුක්නැති උතුමාණනී, දුක්නැත්තාණන්.
කුහුල්ව=සැකව.
උත්තරමිසී=උත්තම යාවෙමිසී, උසස්මිසී.
සුදුපියුමෙක්=සුදුමලෙක්.
පිල්ලූ=(පිළු) කොරු, ජාතිකොරු.
කාසශ්වසාදි=කැස්ස හා ඇදුමාදි, කැසිමුසු ආදි රෝග.

ගංහෝ=ගංගාඕයවල්.

## 21 වන පිට.

ශක්රා=සකුරු.

පස්පියුම්=පඤ්චපද්ම, ඇඹුල උපුලු රත්පියුම්, හෙළපියුම්, කල් හාර යන පස.

වෙලෙප්ශාඛාය=මහාශාඛා හා ශාඛා; අතු හා රිකිලි සමූහය.

දෙබුමු=තට්ටුදෙකකින් යුක්ත.

පියුම් වියන්=පද්මවිතානයන්.

මල්ගුළාවක්=මල්ගෝලයක්, මල්ගුළියක්.

තෙවුනා=බබළන, සෙලවෙන.

වල්විදුනා=වාලව්ජිනීපත්.

පුෂ්පධූප=මල්දුම්, මාලාධූම.

ගන්ධධූප=සුගන්ධදුම්, ගන්ධධූම.

පරිවාසිතවිය=(සුවඳ) කවන ලද්දේවිය. හෙවත් හැමතැන්ම (සුවඳ) පිරීගියේවිය.

පොරගිත්=සොඬඅගිත්.

ජලකණිකාසෙන්=ජලඉසින කෙම්සෙන් දියබිඳුවලින්

ඇත්පොව්වන්=හස්තිපොතකයන්, ඇත්පැටවුන්.

(19)

මඬුවන්=මණ්ඩූකයන්, මැඩියන්.

"අග්ගොහමස්මි ලොකස්ස, ජෙට්ඨොහමස්මි ලොකස්ස, සෙට්ඨොහමස්මි ලොකස්ස, අයමන්තිමාජාති, නත්ථිදානි පුනබ්භවො" යි මේවනාගී සියලු බුදුවරයන්ගේ සිංහනාද යයි. එහි භාවය- මම (දැන්) සමස්තලෝකයට අග්‍රවූයෙමි, ජ්‍යෙෂ්ඨවූයෙමි, ශ්‍රෙෂ්ඨවූයෙමි, මේ මාගේ අන්තිම උත්පත්තිය වන්නේය, යළිත් උත්පත්තියක් මට නැත්තේය.

ජයතුරුසක=ජයසකත්, ජයසිහිවීමට පිඹින සක්ගෙඩිය.

## 22 වන පිට. (19)

නාගමාණවිකාවන්=නාගමාණවියන්, නාලියන්.

වන්දිභට්ටයන්සේ=සතුති පාඨකයන්මෙන්, සතුති වශයෙන් ගුණවණීන විරිදුකාරයන්මෙන්.

පඤ්චසිඛදිව්‍යපුත්‍රයා=පන්සිළු නම් වීණාගායක දෙවතාවා. පඤ්ච=පස, සිඛ=සිළු හෙවත් කොණ්ඩය, මොහට සිළු පසක් ඇති හෙයින් පන්සිළුනම්.

මානයේ=ප්‍රමාණයේ.

මිලක්සා=මලක් සමාන.
දෙසිද්ද=(දෙ+ඉද්ද) ඉද්දමල් දෙක, සීනිද්ද, බොලිද්ද දෙක.
සුරභිඋපුල්=සුවඳ මහනෙල් විශෙෂයක්.
පරසතු=පාරිජාත, දිව්‍ය ලොකයේ මල් විශෙෂයක්.
කෝවිළාර=කොවිදාර, යුගපත්, කොබෝලීල.
කුරුකේ=සුවඳ හමන ගොඩමල් විශෙෂයක්.

(20)

සතරයාළු දසාමුණක්=යාල් 4 ක් හා අමුණු 16 ක්, යාළුකට අමුණු විස්සකි.
සෙව්වන්දි=රෝසමල්.
සෞගන්ධික=සුගන්ධික පුෂ්ප; ඕලුමල්.
මරුවවිදුවන=මල්විශෙෂයන්.
බෙලුවපාණ්ඩුවීණාව=පන්සිළුගේ තුන්ගව්වක් උසඇති එනම් වීණාව, රවිකිස්කූය. *
ලොහිතඞකමය= රක්තමාණික්‍යයෙන් සෑදූ, ලොහිතනම් ලෙහෙසි; ලෙහෙවන් මැණික ලොහිතඞකනම්.
කණාමෘත=(කණ්+අමෘත) කනට අමෘතයක් ලෙස, කනට වැටෙන අමාවක්.

23 වන පිට. (20)

සවාමිදරු සිගිත්තාගේ= ළදරුවූ සවාමිදරුවාණන්ගේ; බොල දවූ සවාමිදරුවාගේ.
ධනලාභී=ධනයට ආශාවත්, ධනවත්.
පතුල් සුන්දෙක=පතුල් සුගුදෙක, කුඩාපතුල් දෙක.
ජටාගෙහි=තලප්පාවෙහි.

(21)

ලදපස්මල්= බැදිසුන්සාල්, අබ, තණහාල්, විලද, සමන් කැකුළු යන පස.
වෙදය=සෘග්, යජුර්, සාම අථර්ව යන බ්‍රහ්මදෘෂ්ටිය; සතරවෙද ශාස්ත්‍රය.
අටෝරාසියක්=(අට+උතුරු+සියක්) එකසිය අටක්.
ඉඳුල් තොඑ=තොළුගා ඉඳුල්කළු ආහාර.
කපිළුවන්=පිංගලවර්ණය, ගිනිදැල්පාට
ලක්ෂපුස්නා=ලක්ෂයක් වටිනා.
සතර පූර්වනිමිත්ත=බුදුවීමට පෙරදුවූ නිමිති සතර, ඔවුහු කවරහයත්– ජරාරූපය, ව්‍යාධිරූපය, මෘතරූපය, ශ්‍රමණරූපය,"යනුයි.
අරමණනාස=කෙළවර මොටවීගිය නාසය. ළදරුනාසය.

---

* බෙලු යනු හින්දි භාෂාවේ වීණාවට හෝ රවිකිස්කූයට කියන නමයි

එක්මැසිවූකල=එක් මාසයක් ගතවූකල.

**24 වන පිට.**

වප්මඟුල්=වැපිරීමේ මඞ්ගල්‍යය.
සේවතුන්=සේවක සත්‍රීන්.
ආනාපානචතුත්‍ථධ්‍යාන=ආශ්වාස ප්‍රශ්වාස කිරීමෙන් පවත්නා සතර වන ස්මෘති භාවනාව.

(22)

යසශ්‍රී=කීර්ත්‍ති ශ්‍රීයාව, යසස් හා ශ්‍රිය; දුනුමුඩාව=දුනුකෙලවර.
දාරාභරණය=සත්‍රීන් පොෂණය කිරීම.
අඞ්ගිරසකුමාරයෝ=බොධිසත්ත්ව කුමාරයෝ, අඞ්ගිරස් සෘෂිහුගේ ගොත්‍රයෙන් උපන් හෙයින් සිඩාළු කුමාරයෝ අඞ්ගිරස නම් ලබත්, ශරීරයෙන් බඹයක් පමණ රශ්මි මාලාවෙන් යුක්ත හෙයින් බුදුවරයෝ හෙවත් බොධිසත්ත්වයෝද ඒ නම ලබත්.

**25 වන පිට.**

හිණිපෙති=ඉණිමංපෙති, ඉණිමංපඩි.
සරත්සමය=ශරත්කාලය.
හීතල ශොභාවෙන්=ඊතල අලංකාරයෙන්.
ජිණ්ණව්‍යාධිමෘත=ජරා, ලෙඩ, මළමිනී.
වීවිපිල් නැමති=වීවී ආශ්‍රිතව පිහිටි පිල් නැමති.
මලස්නෙහි=මල්අස්නෙහි.
පුරසත්‍රී සමූහයා=රාජසත්‍රීන් සමූහය.
මනදෑල=මනෘභී ආශාව; සිත්හී ආශාව. [නම්.
බැදෑණි=නෑනාකෙනෙක්, සහෝදරයකුගේ භාය්‍ය්‍යාව බදෑණි
රුමුහුදෑ=රූපශොභා නැමති සමුද්‍රගුණ ඇත්තා, රූපයේ ලක්‍ෂණය ප්‍රමාණයෙන් කියනොහැක්කාවූ තැනැත්තා යනු හැගවීමයි.

**26 වන පිට.**

විකාර=වෙනස, පෙරළීම්ගති.
බිම්බාදේවින්=එනම් දේවිය; යශොධරාදේවිය.
අතුල් සුග=අලුසිගිත්ත, ඇඩා අල්ල.
කරවැකුණේනම්=අතතැවරිණිනම්.
මලක්වැන්න=මලපතක්මෙනි, තොණ්ඩුවක්මෙනි.
කථක=එනම් බමුණු යාවකයෝ; පථික=මාගීඅතර සිටිමින් සිගමන් ඉල්ලන යාවකයෝ.
පෞරාණික=ව්‍යාසාදි සෘෂීන්කල ශාස්ත්‍රය දත් හිගත්නෝ.
තාර්කික=තර්කකිරීමෙන් දිවිරැක ගන්න යාවකයෝ.

ගමික=ගම්හිවසන හිඟන්නෝ.
වාදික=වාදකථාවෙන් දිවිරැකගන්නා හිඟන්නෝ,නොහොත් ගායනාදිය කිරීමෙන් දිවිරකින සිඟන්නෝ.
භට=භට යාචකයෝ; බජ*=කොර, කොරු.
බධිර=බිහිරි හිඟන්නෝ.
පඞගු=අත්පා වසඟනැති හිඟන්නෝ.
ගිලාන=වයසින් රොගාතුරවූ සිඟන්නෝ.
දීනා=දීන, බැගෑපත්.
ෂොඩෂවිධ යාචකයන්=දහසය ආකාර හිඟන්නන්.
සතර අපාය=තිරිසන් යෝනිය, ප්‍රේතවිෂය, අසුරකාය, අපාය යන සතර, සැපයෙන් තොරස්ථානය අපාය නම්.
අසර=මාගී හසර.

27 වන පිට. (24)

කාමාදිවිතර්කයෙන්=කාම, ව්‍යාපාද, විහිංසා, යන තුන් ආකාර අරමුණෙන්.
උතුරුසළ නකත=උත්තරාෂාඪ නක්‍ෂත්‍රය, නකත් 27 න් විසි එක්වැන්න.
අට ඉස්බක්=බඹ 280 ක් දුර. [කාලයක්
බුද්ධාන්තරයක්= (බුද්ධ+අන්තරයක්) බුදුකෙනෙකුට අයත්
ශ්‍රමණ පරිෂ්කාර=මහණ පිරිකර, පැවිජි කෙනෙකුට වුවමනා කරන පිරිකර.
හත්සළුදෙක=හැඳිවස්ත්‍රදෙක, හැඳිශාටක දෙක.

28 වන පිට. (25)

දුෂ්කරක්‍රියා= බොධිසත්වයන් සැපවත් ආහාර පානාදියෙන් ශරීර පොෂණයට ඉඩනොතබා යත්තමක් අනුභවයෙන් විසීමෙන් සයවසක් කළදුෂ්කර ක්‍රියා.
විසානැකත= 8 වෙනි පිට බලනු.
භික්‍ෂාචාර=පිඬු සඳහා හැසිරීම.
සමවත් සුවෙන්=සමාපත්ති සැපයෙන්.
කෙලෙඹි පුත්‍රයාගේ=ධනවතාගේ, ගෘහපතියාගේ.
තනපාමුල=තනපුඩුමුල, කිරිබුරුල්ල ළඟ
නවුන්= අභිනවවූ, අලුත්"නැවුන්".
උදැගිනිකොට=ලිප්ගිනිකොට දමා.
දැවාණ වටසේ=පළිඟු බුබුලක්මෙන්.
දක්‍ෂිණාවෘත්තව= (දක්‍ෂිණ+ආවෘත්තව) දකුණට කැරකැවී.

29 වන පිට. (26)

බුහුණනියෙනී=නැගණියෙනි, සහෝදරියෙනී.

වෙලෙච්ච වෙලෙච්ච=ඉක්මනින් ඉක්මනින්.
කනකකටක=රනින් සෑදූවළලු.
රසනා=බඳපටිය, මෙඛලාදාමය, "රසන්දම".
නූපුර=පයේලන "ශිලම්බු" * නම් පාවළලු.
තාඩඞ්ග=කණාභරණ, තෝඩු.
එක්වැටිපාමුදු=එක්වටයකින් යුත් පාලනමුදු.
පාසළඹ=පයේලන ආභරණ, වළලු.
පාදංගා=පා වැසුම්, මේස්; ඔරවැසුම්=උරවස්නා ආභරණ.
විජවස්ත්‍ර=වස්ත්‍ර විශෙෂයක්, හඳනාවස්ත්‍ර.
කකුදපාද=පාමුදු, පාදපත්‍ර, පාදඞගුලි, පාදනඛ යන මේවා
පාදවල ලන වෙනත් ආභරණ විශෙෂයෝයි.
හස්තමුද්‍රිකා=අත්මුදු; කෛපෝට්ටු=අත්වළලු, බාහුවළලු,
රන්සවඩි=රන්හවඩි, රත්රන්මෙඛලා.
මණිකෙවළලු=අත්වළලු.
මණිකෙවඩම්=හස්තාභරණයක්, මැණික්දම.
කාඳුපාප්පු=අත්වැසුම්; පමුතිලිංගං=වහන් විශෙෂයක්.
පට්ටකාර=ශ්‍රිවාභරණ විශෙෂයක්.
කිඞ්කිනිකරන්නාසේ=එකක් උඩ අනිකක් තබන්නාසේ.
සුප්‍රතිෂ්ඨිත=මනාසේ පිහිටි.
වසාරෙද=පෙකිනියෙහි පටන් පහළට තිබෙන ලොම් පෙළ.
එකාවැළ පළන්=එකාවලිය නැමති පැළඳිම්. දසරුවෙන් උර
යක් පන්නා ලනමාලය.

### 30 වන පිට. (27)

කාලනාගරාජයා=එනම් නාගරාජයා; තුන්පය=ප්‍රාසාදතුන.
දිවාවිහාරකොට=දවල්වි සීමකර, දවල් වාසයකර.
රසාතලයෙහි=එනම් නාගලොකයෙහි, අතල, විතල, මූතල
රසාතල, තලාතල, මහතල, පාතාලයන නාලෝ
සතින් එකක්.
රන්ඇගෑය=සවණ්ණ අග්ඝිකාව, රන්ගෙඩිගේ.
සුවඳවිතක්=පුෂ්පභාජනයක්.
කුසතණ=කුශතෘණ, ඉලුක් විශෙෂය,
සතර වියඞ්ගාධිෂ්ඨානයෙන්=සතර අඞ්ගයකින් යුත් වීර්‍ය අධි
ෂ්ඨානය, ලේ මස් වියළීගොස් සම්නහර ඇටශෙෂ
වෙතත් අත්නාරිම් කරන අධිෂ්ඨානය.

### 31 වන පිට. (27)

සන්තුසිත=එනම් දෙව්ලොව; සුසාම=එනම් දෙව්ලොව.

---

* ශිලම්බු යනු දඬ කඟිත වළල්ලට දෙමළෙන් කියන නාමයයි. ද්‍රවිඩ ස්ත්‍රීයෝ මෙය බොලට මතුවේ පළඳිත්.

විෂය=බලය, තත්වය; වසවත්තිමාරයා=වසවත් මාරයා.

32 වන පිට. (28)

දසබිම්බරක් සෙනාව= (දශභුම්බාරයක්) බිම්බරදසයක් සේනාව, සේනාබිම්බරයක් නම් පෘථිවියේපැත්තක සිටිකල අනිත්පැත්ත මතුවනතරම් මහත්සේනාවක් බැව් කියාතිබේ.

කියටි=කියනාදේ.

අඳුන්කුළක්=අඤ්ජන කූටයක්, ගිනිකන්දක්.

යමුගුරක්=යකඩ මුගුරක්, යකඩ පොල්ලක්.

ඉඟිකරුව=ඉතාඕනෑකමින්.

ඇණිලා=යුධසමූඳතබා, බළසෙනග සිටවා.

සැහැසී=කෝපවී, තරහයෙන්.

භාස්කර හංසරාජයකුසේ= සූර්‍ය්‍යයාමෙන් බබළන තෙජවත් හංස රාජයකුමෙන්.

33 වන පිට. (29)

වාමාවෘත්තව=වම්දෙසට කරකැවී, වමට හැරී.

පංශුකදම්බයෙන්= පස් රාශියෙන්.

උන්නාදයක්සේ=උස්හඬක්සේ.

හකුරු සමූහයෙන්=ගල්කැට සමූහයෙන්.

උල්කා=තරු, තාරකා.

ජාලාකවුළුව=දැලක්මෙන් සිදුරු සහිත කවුළුව.

(30)

ගිපගිළිය=ජිතලයේ මුල; ලකැඩි=ඉලක්කය කැඩි.

අනුරාගය=ඇල්ම.

අඩයටිගෙන=දමාගසන හෙල්ලයක් ගෙන.

විපලක්=විපලසක්, විමල්ලක්.

සමක්බරලන්නාසේ=හමක්වේලීමට බිම බරතබන්නාසේ.

කුන්තය=එනම් ආයුධය, හෙල්ලය.

දැගලෙකැලූසඳුන්සේ=අඹරන ගලක දැමූ සඳුන්මෙන්.

ඉස්බොල්ල=ගිනියම්කළ යකඩබෝල දමා විසිකරන ආයුධ විශෙෂයක්, හිස්කබලහෝවෙයි.

පාරාවළලු=හාත්පසින් කැපෙන යුධායුධයක්.

වජ්‍රායුධ=විදුරු ආයුධය; අතුනු=බඩවැල්.

ත්‍රිශූල=හුල්තුනකින්යුත් ආයුධය, ඊශ්වරයාගේ එනම් ආයුධය.

පොරෝඳු=පිළීයෙන් කළ උපකරණයක්.

34 වන පිට. (31)

දානපාරමිතා=දාන පිරීම් සඞ්ඛ්‍යාත පාරමිධර්‍මය.

ලතරවුහ=දැඩිවුහ, තදවුහ.

තුන්අඟ=ත්‍රිවිධඅඞ්ගය. එනම්– සාධාරණ කමින් ලැබූ දෙය, තමන් ගැන නොබලා නොපසුබැසදීම. ශ්‍රද්ධා වෙන්දීම.

දෙඅඞ්ග=අඞ්ගදෙක, සතුටින් පිළිගැනීම හා එය වැළඳීම.

කෙසරු නැමති=කෙශරවැනි, මල්රේනුවැනි.

**35 වන පිට.** (31)

දස්කම්=දාසකම්, මෙහෙකිරීම; මුවවිට=ගැටිය, මෝවිට.

ශිලපාරමිතාව=ශීලය පිරීම් සඞ්ඛ්‍යාත පාරමිධර්මය.

අභිගුණ්ඨික=නයින් පාලනයකරන, නයින්නටවන.

පොළුනැගෙන කලක්මෙන්=ගෙඩි(ගඩු) නැගෙන කලක්සේ.

මානසික දුක්ඛින්ද්‍රියයක්=සිතට දුක් ඇතිකරන හෙතුවක්.

වාලධිය=වල්ගය, වල්ගාපත; කොල=බොල, එම්බා.

නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව= තපස්රක්‍ෂා කිරීම් සඞ්ඛ්‍යාත පාරමිධර්මය; අභිනිෂ්ක්‍රමාණුගත පාරමිධර්මය.

වැසිකිළියක්=වර්චස්කුටියක්, කක්කුස්සියක්,

**36 වන පිට.** (32)

බල්‍යයෙහි=බාලස්වභාවයෙහි, බාලවයසේ.

සමනක්=ස්වාමි පුරුෂයෙක්.

පහළ=පහර, ප්‍රහාරකළ.

ප්‍රඥාපාරමිතාව=නුවණ පිරීම් සඞ්ඛ්‍යාත පාරමිධර්මය.

කෙළිකොළුසහයක්=උපකාරයට කොල්ලෙකු හෝ කෙල්ලකුගෙන ඊමක්.

**37 වන පිට.** (33)

ජඩවූ=මෝඩවූ, තදමෝඩවූ.

කඩදත්මාල්ල=කැඩුණු දත්ඇති මහලු මිනිහො, වැටුණු දත්ඇති නාකියා.

අත්සුණු=අග්ගලා, සතතුහකත.

අතගුලෙන්=(අත්+අගුලෙන්) අතින් අරින වහන අගුලෙන්.

අඹුළු දූරිකතුන්=භාය්‍යාව වන ළපටි කානතාව.

අසබාදෙයක=නිශ්චයකොට නොහැකි කාරණයෙක.

සොරසාද කථාවකුත්=හොර මිත්‍රකථාවකුත්, සාද යනු මිත්‍ර බවයි.

ලකවැළක්=ජපමාලාවක්; පිළිකුඩයක්=රෙදි කුඩයක්.

මන්ත්‍රපොත=බ්‍රාහ්මණයන් විසින් යාගමන්ත්‍ර පිණිසගෙන යන පොතක්.

ගුළිපසිය=ගුළිදමන පසුම්බිය; කොණ්ඩිය=කොතලය.

සකත්=හක්ගෙඩියත්; අනුරූපවූ=සමානවූ, වූවමනාවූ.

එක්පට වහන් සගල=තනිපටක් ඇති සෙරෙප්පු කුට්ටම.

සුඟක්කා=ටිකක්කා, ස්වල්පයක්කා

විෂඝොර=විෂයෙන් ඝොරවූ, නපුරු විෂඇති.

38 වන පිට. (34)

අනන්තාපරිමාණ=(අනන්ත+අපරිමාණ) කෙළවරක් නැත්තාවූ, අසංඛ්‍ය.

ධම්ශුක්ති=යහපත්ලෙස යුක්තිය ඇතිකිරීම.

නළල=ලලාටය, නළල්ශබ්දය නිඩාලයන ප්‍රාකෘතශබ්දයෙන් භින්නයි.

සියොලඟ=සකල ශරීරය, සියලු අවයව.

සාධුකාරයෙන්=සාධු (යහපත)චේවා යන ශබ්දකරණයෙන්.

දෑඩමලුනූවූයේද?=අධික ඝොෂාවෙන් ඉවරයක් නූවූයේද.

ගෙට ගියහොත් අඹු මියෙහි මඟ ලැග්ග හොත් තෝ මියෙහි=ගෙට ගියහොත් භාර්‍යාව නසන්නීය මාර්ගයෙහි නැවතුන හොත් තෝ නසින්නෙහිය.*

අඹුසිහිත්ත=බොළඳ බිරිඳ, බාලවයසැති භාර්‍යාව.

මියන කාරණාව=මැරෙන හෙතුව.

පැන්බොත්නටයාදී=පැන්බොන්නට (යද්දී) ගිය අතර.

39 වන පිට. (35)

සිටිසේ සිටම=සිටිසැටියටම එතනම සිට.

ඔල්වරහඬ=ප්‍රීතිඝොෂාව, සතුටුනාදය.

බැණවීය=කථාකෙළේය.

පසාරයෙන්=ආකාරයෙන්, සැටියෙන්.

නිවහල්බව=ඉතා දුක්පත්බව, උපකාරනැති බව.

රැහැණීව=කෝපව, විරුඩව.

දැළිපත=දැඨාව, රැවුල්පත, මහත්රැවුළ.

ළෙන් ඇවිල=පපුවෙන් ඇවිලී, හෘදයදැවී.

මිසුඹුරු සුසුමක්ලා= සිහිල්ලීමක් හුල්ලා, මහත්සේ හුල්ලා යනුයි. මිසුඹුරු යනුද හීල්ලීමට නමකි.

ආන ආනා=ඇනුම් ඇර ඇර.

---

* තොක්වෙයි තොකිය අපවත දෙය බමුණු අ ද
කොරුකොයි බැමිණිගෙට ගිය මඟ ලැග්ග තො ද

## 40 වන පිට.

ම්ස්සෙන්දහස=මසුවලින් දහස, මස්සක් නම් පනම් හයක් ශත 32 ක් පමණ වටින මිල විශෙෂයෙකි.

සමාධිවූහ=සිත් එකඟකරගත්හ.

කලඟහට=කළයුතු නිඤ, අපහාස.

අලදෙරක්=හල දෙරක්, හලයන්ගේ හකාරයාගේ ලෝප යෙන් "අල" සිඝිඛයි.

පැලදෙර=පස්සාදෙර, ගෙවල පසුපැත්තේ පිහිටි දෙර.

## 41 වන පිට.

මණිමෙඛලා දෙව්දුව=එනම් දෙවතාවී, මණිමෙඛලා යන් නෙත් මැණික්මය මෙවුල්දමය යන අර්ථගෙනදෙයි.

පරිභව නොවන්නේය=නින්ද, නොවන්නේය.

(37)

මුදුබත්වූහ=මුහුදට ගොදුරුවූහ, මුහුදේ ගිලී ගියහ.

දිවපහස්=දිව්‍ය ස්පර්ශය.

පුස්රථය=කෙළි පිණිස ගෙනයන විචිත්‍රරථය.

ක්ෂාන්තිය=ඉවසීම, සතුරන්ට දඬුවම් කරන්ට ශක්තිය තිබී යදීත් එසේ නොකර සිටීම.

කලාබු රජ්ජුරුවන්= කාශ්මීර දෙශයේ රජකළ රජෙක්.

අන්තඃපුරවාසීන්=ඇතුළු නුවරවාසීන්, රාජස්ත්‍රීන්.

ඇකයේ=උකුලේ.

## 42 වන පිට.

කටුසැමිටිය=කටුසහිත කසය.

ඒසා=ඒ සමාන; කම්කටුලක්=වධයක්; පීඩාවක්.

ඌනතාවක්=අඩුබවක්, පිරිහීමක්.

කම්බලයෙන්=බලවත් කර්මයෙන්, මහත් අකුශලයෙන්.

සත්‍යපාරමිතාව=සත්‍යය පිරීම සඞ්ඛ්‍යාත පාරමිධර්මය.

පුසනැකතින්=පුෂ්‍යනක්ෂත්‍රය, නකත් 27 න් 8 වනු නැකත.

සතාරහගාථා=සත්පුරුෂයන් සෙවනය කිරීමෙහි උතුම්බව හගවා කියනලද ගාථා පංක්තියක්.

## 43 වන පිට.

මඟුල්සලෙහි= මඞ්ගල්‍ය ශෛලයෙහි, රජු වාඩිලන ගලින් සෑදූ රාජාසනය.

දියදෙබ්කොට=ජලය විභෙදකොට, දිය භාගදෙකක්කර.

සුතසෝම බෝධිසත්වයෝ
පෝරිසාද=එනම් සොරා, ~~ගෞතම සර්වඥයන් වහන්සේගේ කාලයේ සිටි භයානක චෞරයෙක්~~.
අස්වමින්=නමකියමින්, නමගෙනහැරපෑමින්.
ඇතැරුවෝ=ඇතුත්පිටයන්නෝ.
මිටිමියරපොල්ලක්=උසනැති මියර (නියර) ක්.
අත්බඹරක්=ක්‍රීඩාබඹරයක්, අතින්ගහන බඹරයක්.
එලකායුධ=පලිඝ, එලක=පෝරුව, පලිහ ලෑල්ලක්මෙන්වන හෙයින් එලකායුධය නම්.
කඳුළුපෙතකැයි=කඳුළුපොදකැයි; නොබානා=භයනොවන.
ලොකාතීත=ලොකය ඉක්මෙවූ, ලොකයෙහි අධිකවූ.

(39)

ආත්මප්‍රේමයකින්=තමාකෙරෙහිවූ ආදරයකින්.
සම්භවවීම්=පැමිණවීම, සම්බවීම්, සම්භවයයනු උපැත්මටද නම්.
සබාරසට=සත්‍යය නැමති රසයට.
පටුන්ගමට=පට්ටනමට, වෙළඳ ජනයන් වසන මූදුබඩගමට.
බිලියමට=බිල්ලට, බිලිවීමට.
බිමතුබූමළ=බිමතිබුණු (කුණු) අශුචි.

## 44 වන පිට.

ධර්මින්=නහර.
මස්පළුහන්ට=මස්පුලුස්සන්ට; මස්බදින්ට.
අධිෂ්ඨාන පාරමිතාව=මෙසේවේවායි තරයේ සිතීම් සංඛ්‍යාත පාරමිධර්මය.
තේමියරජු= එනම් බොධිසත්වරාජයාණෝ.
ජාතිස්මරණඥාන=පෙරවිසූ ජාතිසිහිකිරීමේ නුවණ, පූර්වනිවාසනුස්මෘතිඥානය.
නොගොළුව=ගොළුනොවීම; ගොළුවකුව නොසිටම.

(40)

ගොළුගතුව=ගොළුවෙක්සේ වෙව.
තුන්අඟ අධිෂ්ඨාන=ත්‍රිවිධ අධිෂ්ඨානය, එනම්– ස්වකීය ශරීරයේ අවයවයන් විනාශවෙද්දී පවා සිතූ සිතීමත් වෙනස් නොකිරීම, දරුවන්ගේ ජීවිත ආදි බාහිර වස්තු විනාශවෙද්දී පවා සිතූ සිතීම වෙනස් නොකිරීම, ස්වකීය ජීවිතය විනාශයේදී පවා සිතූ සිතීම වෙනස්නොකිරීම යන මොව්හුයි.

## 45 වන පිට.

වක්කන්තෙන්=වක්කන්යනු කොටසට කියනමකි.
සිසිලස=සීතලය,
මුචලිඳුනම් නාගරාජයා=බුදුරජාණන් වහන්සේ බුදුවූ සත් සතියේ වැසිවස්නා සමයෙහිමේ නාරජුගේ භෝගාවලියේ මතුවැඩසිට පෙණගොබය යට ආවරණව වෙසෙමින් බණ දෙසූහ.

“සවන සතියැ වැසි වසිනා දස දිනෙ හි
පෙණින සෙවෙණි මුදලිඳු නා දරණගෙ හි”

භොගාවලිය=දරණවැල, දරණගෘහය.
මුඛබාතේලා=තොණ්ඩුව කරෙහිදමා.
ධර්මතාය=ධර්මස්වභාවය, ධර්මය අනුරූපව පැවතීම.



නෘත්‍ය ගීත වාද්‍යයෙහි= නැටීම, ගී කීම, වැයීමෙහි.

## 46 වන පිට.

තම්ලුලිය=තමාලලතා, බුලත්වැල, තම්ලුයන්නෙන් කොල් ලන්ද කියවෙත්. නමුත් ඒ රුක් වෙසෙසෙකි.
කොද කැකුළ්=නුපුබුදු කුමුදුමල්.
ස්වර්ණහංස=රාජහංසයෝ, “රාජහංසාසතුතෙ චඤ්චුචරණෛ ර්ලොහිතෛස්සිතාඃ” යන මෙයින් රත්දෘ තුඩු හා පා ඇති සර්වාඞ්ග ධවලවූ හංසයන් රාජහංසයයි කියත්.
මනාසිඟුවලඟ=මනොඥවූ සිඟින් ඉඟටිය, සිඟින් ඉඟටියක් හා පලල් උරයක් ඇතිවීම ස්ත්‍රීන්ට ශොභාවක්වේ.
වසාරාජි=රෝම සමූහය, මවිල් සමූහය.
ලියවනයට=ලතාවනයට, ලිය නම ලතාවනයට.
වලිත්‍රයක්=විලිතුනක්, රෙඛාතුනක්

“වන්නැබ වල සිටුවම්නි වසාය ට
තුන්විලි මහ බඹු බැඳි වැනි සැරප ට”

ඇඹුල්මල්=කුමුදුමල්, ඕලුමල් හෝයි.
මිණිමෙවුල්දම=මැණික් ඔබ්බවා කරනලද මෙඛලාදාම.
දෙවටොර=(දෙ+වට+උර) වටවූ දෙවුර; සදග=පාදාභරණ විශෙෂයක්.
සලඹ=පයෙහි ලන වලලූ විශෙෂයක්; වසිලඹ=පාවහන්, පාදාභරණ.

අවමඟුල් රථය= මළමිනීගෙන යන රථය.
දිවිහිමියට=ජීවිතාන්තයට, දිවිකෙළවරට.

47 වන පිට.

සිවුරැස්=හතරැස්, සම පැති සතරක් ඇති.

(41)

කසිරජ්පුරැ°වා්=කශිදෙශයෙහි රජාණෝ, කශිරට උතුරු ඉන්දියාවේ මැදින් පිහිටි ජනපදයකි. බරණැස අගනුවරයි.
මල්කලඹක්=මල්පොකුරක්, මල්මිටියක්.
පිටල්ලෙන්=පි◌දොරින්, පස්සා දොරෙන්.
සුපුෂ්පිත=මනාසේ පිපුණු, හොඳට පිපුණු.
කඹුරසමක්=මයිත හමක්, ආචාරියාගේ ගිනි පිඹින හම.
පශ්චිමාන්තය=(පශ්චිම+අන්තය) පස්සා පැත්තේ කෙළවර.
වෙරහෙත්නම්=පොරට ඒනම්, පොරුබැඳුවේනම්.

48 වන පිට.

හෝවිල්යාන◌ාවක්= පැද්දෙන සයනයක්, උඤ්ඤල්ලාවක් (හකාරලොපයෙන් ඕවිලියි සඩයි)
බදුවදමල්=බන්ධූජීවකපුෂ්ප, සපත්තුමල්යයි මෙකල භාවිතා කෙරේ.
හුණුකැමැත=උෂ්ණය කැමති හොත් (හුණ=උණු).
පෙරතුව=පූර්ව, ඉස්සර.

(43)

දියෙන් ගැඹුරැ=ජලයෙන් පිරුණු, අධිකජලයෙන් යුත්.
මෙඝඩවනියක්=මෙඝශබ්දයක්, අහසගෙරවීමක්.
සිත් පිත් නැති=සිතක් පිතක් නැති.
එෙරාවණ=එනම් ඇතා, ශක්‍රයාගේ හස්තියා, "අසිරාවන වුවත්නම් නරිසින් එන" එෙරාවණ හස්තියා සංග්‍රාම යෙහිද වීරයෙකි. බලවත් එකෙකි. එෙරාවන දිව්‍ය පුත්‍රයා ගත් හස්තිවෙශය.
කුරවිකනාදයක්=කොවුල් නාදයක්, කෝකිලයාගේ නාදය ඉතා මිහුරැයි කියති.

එයින් කීහ:- "කුරවීනද වීර ස
කා◌වෙණ නදට අපහ ස"

49 වන පිට.

බත්දෙන=ආහාරදෙන, තමාට ආහාරදී පොෂ්‍යකරන යනු අභිප්‍රායයි.

(44)

මිත්‍රද්‍රොහි=මිත්‍රයන්ට ද්‍රොහකරන්නා, මිත්‍රයන්ට අපරාධ කරන්නා.

ඌනතාවක්=අඩුකමක්, අසම්පූර්‍ණකමක්.

රන්කෙහෙල්ලියක්=ස්වර්‍ණකෙතුවක්, රත්රන් වැඩ කරන ලද කොඩියක්.

බුඩකෘත්‍ය=බුදුකිස, බුදුවීම සඳහා කරනලද ක්‍රියා, පෙරුම් පිරිමාදිය.

රන්වන් මුවරජව=ස්වර්‍ණවර්‍ණ මුවරජව.

මුවදඩයමෙහි=මුවන් මැරීමෙහි, දඩ යනු වනයට හෝ ගම නට නම්.

ගිජුවගෙන=මහත් ලෙස ආශාවී.

විත්කන්නා=විනිවිදයාම්.

## 50 වන පිට.

ශාඛා මුව රජ්ජුරුවෝ= උප මුවරජ්ජුරුවෝ, ආධාරකාර මුවරජ.

අභය=නිර්භය, කැමැත්ත, නිදහස.

දූරි ඇති=දරු ගර්‍භයක් ඇති, ගර්භිණිවූ.

මූකුරුවාහු=මේරුවාහු, වැඩුණාවූ.

අනිත්දසින්=අනිත්දැසින්, එසින් තුන්වන දවසින්.

දම්ගෙඩියෙහි=මස් කපනකොටයෙහි, හිස්සිඳින කොලොම් බුවෙහි.

තම තමන්ට සිතත්මුත්= තම තමුන්ගේ කාරණගැන කල්පනා කරන නමුත්.

මරුකතර=වාලුකා කාන්තාරයෙහි.

ගැල්සාත්තුවක්=කරත්ත සමූහයක්.

සාත්තුවාහයෙකු=සමූහය ගෙනයන ප්‍රධානියකු.

## 51 වන පිට.

මාවුලාව=කොට්ටය, මෙත්තය.

මන්‍ද්‍රිදේවින්ගේ=මද්‍රරජුගේ දූගේ;හස්පැටවුන්=හංසපැටියන්.

(46)

තනසඟල=පයොධර යුග්මය.

පරදුඃඛ=අන්‍යයන්ගේ දුක; අනුන්ට පැමිණි දුක.

පරිත්‍යාගකොට=තැගිවශයෙන් දී; අත්හැර.

## 52 වන පිට.

උපෙක්‍ෂා පාරමිතාව= මධ්‍යස්තාව නැමති පාරමිතාධර්මය, සැප දුක් දෙකෙහි මධ්‍යස්තාව.

මිටි මුගුරු කැට=මිටි, පොලු, ගල්කැට; මුසුකල=මිශ්‍රකල, සංයොග කල.

කරයකින්= දැළිපිහියකින්, පිහියකින්.

උපෙක්‍ෂාව=(උප+ඊක්‍ෂාව) මධ්‍යස්තාව, මැදහතුකම, සැප හා දුක ලැබෙන කල මධ්‍යස්ථව ඉවසීම.

කරපය මැසුව්=කර හා පය එකට අල්ලා මැසීම, පාදදෙක හා බෙල්ල එකටතබා මැසීම; කුඹින්=කුඹස්ථාලයෙන්

## 53 වන පිට.

ගිනිසලා=ගිනි සුළි; ගිනිදැල් සමූහය.

පූළුන් පෙදක්සේ=පූළුන් පොදක්සේ; පූළුන් රළක්මෙන්.

සිවුරුකණකින්=සිවුරු කොනකින්.

සඳුන්පොඩිසේ=සඳුන් කුඩුසේ; කුඩා සඳුන් කැටමෙන්.

හුනුකලල්=හුනුමඩ; කලල්කරනලද හුනු.

කිළිල්කඩක්=වෙබඩක්, ගසකබඩයක්.

පාරුවලල්ල=වසමාතිනිමාරයාගේ අනුහා සම්පන්න වළල් ලක ආකාර ඇති යුඩා යුධයක්.

සලාලාගැසිය=සොලවා ගැසීය; දෙස් කියවයි=සාක්‍ෂිකියවයි.

(48)

මණිකාන්තාව=මිණිකත; පොළොව නැමති ස්ත්‍රිය.

## 54 වන පිට.

සිරිවස්පෙළ=ශ්‍රීවත්ස පංක්තිය, මඞ්ගල්‍ය ලක්‍ෂණයෙන් යුත් විනිජි විශෙෂයක්.

වල්විදුනාපෙළ=වාලව්‍යජන පංක්තිය, චාමරපංක්තියක්. සෙමරුන්ගේ වාලධියෙන් තනාගත් පවන්පතක් පෙළ.

රන්අකුසුපෙළ=සුවර්‍ණාඞ්කුස පංක්තිය.

රුවන්කළස්පෙළ=රත්නමය කළගෙඩිපෙළ.

රන්දදපෙළ=සුවර්‍ණධ්වජ පංක්තිය.

රන්ඇගෑ=රන්තොරණ, සුවර්‍ණාසිකාව.

රුවන්මොරඟු=රත්නමය යෂ්ඨී.

වියනෙක්=විතානයක්.

දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්‍ණ ගරුඩ ගන්ධර්ව=දෙව් බඹු නා ගරුඩ ගුරුළු ගන්ධර්ව.

දිව්‍ය නම්=ශක්‍ර ආදීහුයි. බ්‍රහ්ම නම්=සහම්පතී ආදීහුයි.
නාග නම්=පාතාලවාසී නාගයෝයි.
සුපර්ණ නම්= ශක්‍රභවනය ප්‍රවේසම් කරන පිණිස මහමෙර පත්ලේ විතිය සීමාවේ මුරකරන දෙවතා විශේෂයක්. මනාවූ පියාපත් ඇති හෙයින් සුපර්ණ නම්. ගුරුළෝද සුපර්ණවර්ගයකි. ඔව්හු දෙපක්ෂයම නාගයන්ගේ සතුරෝවෙත්.
ගරුඩ නම්=නාගයන් ගෙනයන ආක ශවාරිගුරුළෝයි; ගන්ධර්වයෝ නම් සුපර්ණයන්මෙන්ම ශක්‍රයපුරය රක්ෂන තවත් කොටසකි. ඔව්හු තුන්වන සීමාවේ මුරකරන ගායක පිරිසකි.

**55 වන පිට.**

පූර්වනිවාසානුස්මෘති ඥානය= පෙරවිසූ කඳපිළිවෙල දන්නා නුවණ.
දිවැස= (දිව+ඇස) දිව්‍ය චක්ෂුස.
ප්‍රතීත්‍යසමුත්පාදය=(ප්‍රතිත්‍ය+සමු+උත්පාදය) සත්වෝත්පත්තිය පිළිබඳව සොළොස් අඞ්ගයකින් යුක්ත එනම් ධර්ම පටිපාටියයි
මහමෙරසා=මහමෙර සමාන.
අලළන්නාසේ=ආලොළනය (කැළඹීම) කරන්නාසේ.
උදන් අනාවදෑර=ප්‍රීතිය ප්‍රකාශකොට වදෑරා.
නවානු දහසක්=(නව+අනූ+දහසක්) අනූනව දහක්.
කුසින්=කච්ජයෙන්, කිසිල්ලෙන්.

**56 වන පිට.**

නාබතල්කඳ=(නාඹතල්කඳවියයුතු) තරුණ තල්ගසේ කඳ, නාම්බන් තල්කඳ.
යමාමහපෙළහර=යමකමහා ප්‍රාතිහාර්යය, යමකයනු දෙකකට නම්. සර්වඥයන්ගේ ශරීරයෙන් නිකුත්කළ ගිනි හා ජලදෙක.

(50)

අතුවලතත්=අතුරලාතත්, විසිරලාතත්.
අභිධර්මපිටකය= 8 වෙනි පිටේ විස්තර බලනු.
නානානය වශයෙන්=නොයෙක් පිළිවල් වශයෙන්, නානාවිධ ක්‍රම වශයෙන්.
වියරුහුණුවාක් හුගේ=විකාර වැටුණ කෙනෙකුගේ.
තුන්මංසලෙක්හී=තුන්මන්සන්ධියෙක්හී.
අනන්තාපරියන්ත= (අනන්ත+අපරියන්ත) සීමාකළ නොහෙන අධික.
යදම්න්මසා=යකඩදම් වැලෙන්මහා, යකඩදම් වැලෙන්බැද.

## 57 වන පිට.

පොරෝදු බහන්=ගෙත්තම් සිත්කම් කළ කඩ.
මල්දම්සෝළු=මාලාදාම සාටක, මල්දමින් යුක්ත කරනලද සාළු.
නුරා=අනුරාගය, කරුණාව.
ලැසිගත් ගමනින්=අශීඝ්‍රවූ ගමනින්, අලස යන අර්ථයෙහිද ලැසි යනු වැටේ.

(51)

ලැසිගන්වමින්=අභිලාෂ ගන්වමින්, ප්‍රිය උපදවමින්.
මරාඞ්ගනාවෝ=(මාර+අඞ්ගනාවෝ) මාරස්ත්‍රීහු සිදුහත් කුමරු වන්ට බුදුවී නොදෙම්හයි. කාමයෙන් මත්කරනු වස් පැමිණි මාර දුහිතෘහු තිදෙන.
කනතට=(කන්+අතට) කනදෙසට.
නෙතුප්පලෙන්=(නෙත්+උප්පලෙන්) නෙත්‍ර නැමති මහනෙල් මලින්.
රසවතුන්= රසයෙහි ඇලුණුවුන්; කාමයෙහි ඇලුණු ඇත්තන්.
නිල්වරල්බා=නිල්වූ කෙශකලාපය හෙළාගෙන.
මෙකුළු=මෙඝකූට; වැසි වලාකුල්.
දෙව්දුනු=දේදුන්න; ඉන්ද්‍රචාපය.
තඹුරුතඹරවන්=රතපැහැයෙන් යුත් නෙළුම් මල්වැනි.
ලවනාත=තොල්; වතල=පැතුරුණු, විහිදි; දසන්=දත්.
සඳවලාහී=සඞ්ඛවලායෙහි.
දළමුත්හරින්=දෑඩි (මහත්) මුක්තාහාරයෙන්.
ළෙහිමළලා=පපුයෙහි තොණ්ඩුවදමා.
ළඳබොළඳබසන්=බාලවූ ස්ත්‍රීන්ගේ මොළොක්වචනයෙන්; සුරතල් බසින් යනු අභිප්‍රායයි.
මුවසඳමඬල=මුහුණ නැමති චන්ද්‍රමණ්ඩලය.
සුදුරැස්කඳ=ශ්වෙතරශ්මිකදම්බ, සුදුරැස් සමූහය.
ජලවහනය වන=දියවැගිරෙන; දියගලාවැටෙන.
සඳකැන්=චන්ද්‍රකාන්තීන්, සඳරැස්.
උන්මාද=උන්මත්; විහිවිකල, පිස්සු හෝමූර්ච්ඡාවූ.
නිවනට අකුල්වූ= නිවන්යාමේ මගට අකුලක්ව; නිවනට බාදාවූ.
සසරට පිටුවහල්වූ=සංසාරයට පිටුවහල්වූ; සසරට උපකාරවූ.
සුවයට නිධානවූ=සැපයට නිධානයක් බඳුවූ, සැපත උපදින තැනක්වූ.

විළියෙන්=ලජ්ජාවෙන්; හිරියෙන්; ආර්ද්‍රකොට=තෙත්කොට.
පියුම්බී=මල් (පැණි) බී; මත්රදහසුන්=මත්වූ රාජහංසයන්.
පියරුව්=ප්‍රියරූවය හෝ ප්‍රකෘතිරූවයයි.
සල්මල්හි=ශාලපුෂ්පයෙහි; දූඹුල් රුක්හි.
ගුගුරන=නාදකරන; අදළුගුම්=ප්‍රියනාදය, මිහිරිනාදය.
සුපුලඹෙහි=(සුපුල්+අඹෙහි) පිපුණුමල් ඇති අඹගසෙහි.
කෙවිල්ලන්ගේ=කෝකිලයන්ගේ.
මැදපිල්සත්= මධ්‍යම පිල් කුඩය; මැද පිහිටි පිල්කැටිය. මධ්‍යම පිල් ඡත්‍රය.
බැහැවුම්ගත්=පෙරුත්තකරන.
